සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**60 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුයි:
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- (iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- (iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

● පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගිරිකුල මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය, පාසල් සමුපකාර සමිතිය හා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල එකමුතුව, 'තිස්ස සහල් මෝල්' ව්‍යාපාරයේ අයිතිකරු වන දහම් සේකර පරිත්‍යාග කරන සහල් භාවිතයෙන් සකස් කර ලබා දෙන සහල් කැඳ වීදුරුවට පාසලේ සිසුන් රුචිකත්වයක් දක්වයි.

**1.** ගිරිකුල මහා විද්‍යාලය විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක් ද?
(1) ආහාර (2) අධ්‍යාපනය (3) සෞඛ්‍යය (4) ආරක්ෂාව

**2.** ගිරිකුල මහා විද්‍යාලයේ බාහිර පරිසර සාධකයක් සඳහා නිදසුනක් වනුයේ,
(1) අධ්‍යයන කාර්ය මණ්ඩලය ය. (2) අනධ්‍යයන කාර්ය මණ්ඩලය ය.
(3) 'තිස්ස සහල් මෝල්' ව්‍යාපාරය ය. (4) පාසලේ සිසුන් ය.

**3.** ඉහත සිද්ධියේ ඇතුළත් රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයක් වනුයේ,
(1) 'තිස්ස සහල් මෝල්' ව්‍යාපාරයයි. (2) ආදි ශිෂ්‍ය සංගමයයි.
(3) පාසල් සමුපකාර සමිතියයි. (4) ගිරිකුල මහා විද්‍යාලයයි.

**4.** ඉහත සිද්ධියෙහි ඇතුළත් සහල් කැඳ සකස් කිරීමට භාවිත කළ සහල් අයත් වන නිෂ්පාදන සාධකය කුමක් ද?
(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසායකත්වය

**5.** ඉහත සිද්ධියේ ඇතුළත් 'තිස්ස සහල් මෝල්' ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(2) මෙම ව්‍යාපාරය සම්බන්ධ දහම් සේකරගේ වගකීම සීමිත වේ.
(3) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
(4) මෙම ව්‍යාපාරය ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.

**6.** භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් වන්නේ,
(1) සීමාසහිත ලංකා සීනි (පෞද්.) සමාගම ය.
(2) සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව ය.
(3) ශ්‍රී ලංකා ගුවන් සමාගම ය.
(4) ශ්‍රී ලංකා මහ බැංකුව ය.

[දෙවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

7. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සහ ස්වෙච්ඡා හා විවෘත සාමාජිකත්වයක් පැවතීම ව්‍යාපාර සංවිධානයක ලක්ෂණ වේ. එම ව්‍යාපාර සංවිධාන වර්ගය සඳහා නිදසුනක් වන්නේ,
(1) ගුණවර්ධන සහ පුත්‍රයෝ ය.
(2) සී/ස මහරගම විවිධ සේවා සමුපකාර සමිතිය ය.
(3) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ය.
(4) සී/ස ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සමාගම ය.

8. පහත දැක්වෙන්නේ සිදුවීම් කිහිපයකි.
A : රුවන්, 'මොඩර්න් සැලූන්' වෙත ගොස් කොණ්ඩය කපා ගැනීම
B : සපුමල් තම ප්‍රයෝජනය සඳහා ජපානයෙන් මෝටර් රථයක් ආනයනය කිරීම
C : 'සුමුදු මල් වෙළෙන්දෝ' නැවුම් මල් කුඩ දෙකක් මිලදී ගැනීම
D : සමන් සිය අස්වැන්නෙන් වී කිලෝ 50 ක් වී මෝල් හිමියෙකුට විකිණීම
ඉහත සිදුවීම් අතුරෙන් තොග වෙළෙඳාම් වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ D ය. (4) C සහ D ය.

● පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 9 සහ 10 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කසුන්ට රු. 18 000 ක ලංකා බැංකු චෙක්පතක් අරුණගෙන් ලැබුණි. එය 'ගනුදෙනු කළ නොහැක' ලෙස රේඛනය කර තිබුණි. කසුන් එම චෙක්පත තමාගේ මහජන බැංකුවේ ඇති ජංගම ගිණුමේ තැන්පත් කරන ලදී.

9. අරුණගෙන් ලද චෙක්පත
(1) විශේෂ රේඛනය සහිත චෙක්පතකි.
(2) සාමාන්‍ය රේඛනය සහිත චෙක්පතකි.
(3) පිටසන් කළ නොහැකි චෙක්පතකි.
(4) බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගත හැකි චෙක්පතකි.

10. ඉහත සිද්ධියේ සඳහන් චෙක්පතෙහි,
(1) ආදායකයා කසුන් වන අතර, අණලද්ද මහජන බැංකුව වේ.
(2) අණකරු අරුණ වන අතර, ආදායකයා මහජන බැංකුව වේ.
(3) අණලද්ද ලංකා බැංකුව වන අතර, ආදායකයා කසුන් වේ.
(4) අණකරු කසුන් වන අතර, අණලද්ද ලංකා බැංකුව වේ.

11. රු. 1 000 000 ට රක්ෂණය කර තිබූ අමල්ගේ ව්‍යාපාර ගොඩනැගිල්ලේ කොටසක ගින්නක් ඇතිවූ අතර වන්දිය ලෙස රු. 300 000 ක් ඔහුට ලැබුණි. රු. 300 000 ක් පමණක් වන්දිය ලෙස ලැබීමට අදාළ රක්ෂණ මූලධර්මය වන්නේ,
(1) රක්ෂ්‍ය හිමිකමයි.
(2) උපරිම විශ්වාසයයි.
(3) හානිපූරණයයි.
(4) ආදේශනයයි.

12. පහත X තීරුවේ සන්නිවේදන මාධ්‍ය ද Y තීරුවේ සන්නිවේදන මාධ්‍ය සඳහා නිදසුන් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. වාචික | A - පාසලේ තිබෙන සීනුව නාද කිරීම |
| 2. ලිඛිත | B - ශිෂ්‍ය නායක රැස්වීමක් පැවැත්වීම |
| 3. විද්‍යුත් ලිඛිත | C - දෙමාපිය රැස්වීමට කැඳවීම් ලිපි තැපැල් කිරීම |
| 4. සංඥා සහ සංකේත | D - කලාප අධ්‍යාපන කාර්යාලයට ෆැක්ස් (Fax) පණිවුඩයක් යැවීම |

ඉහත සන්නිවේදන මාධ්‍යය, නිදසුන් සමඟ පිළිවෙළින් ගළපන ලද පිළිතුර තෝරන්න.
(1) B, C, A, D (2) B, C, D, A (3) C, D, A, B (4) C, D, B, A

13. 'යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ ආකර්ශනීය ලෙස නවීකරණය කිරීම'
මෙම ප්‍රකාශය තුළ ගම්‍ය වන ප්‍රවාහන මූලිකාංගය වන්නේ,
(1) මාර්ගයයි. (2) මාධ්‍යයයි. (3) බලයයි. (4) පර්යන්තයයි.

14. "ආයුරා සුව මැදුර ප්‍රතිශක්තිකරණ ජනන පානයක් නිෂ්පාදනය කිරීමට තීරණය කරන ලදී."
මෙම ප්‍රකාශය තුළ ගම්‍ය වන කළමනාකරණ කාර්යය සහ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යය පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) සැලසුම්කරණය සහ ප්‍රවර්ධනය
(2) සංවිධානකරණය සහ මිල
(3) සැලසුම්කරණය සහ නිෂ්පාදිතය
(4) සංවිධානකරණය සහ නිෂ්පාදිතය

[තුන්වැනි පිටුව බලන්න.

15. ලාභාංශ ආදායමක් ලැබෙන ආයෝජන මාර්ගය වන්නේ,
(1) සාමාන්‍ය කොටස් මිලදී ගැනීම ය. (2) ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම ය.
(3) ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීම ය. (4) ස්වර්ණාභරණ මිලදී ගැනීම ය.

16. ආයෝජන සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඉඩම්වල ආයෝජනය කිරීම මගින් ප්‍රාග්ධන ලාභ උපයා ගත හැකි ය.
(2) රජයේ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි.
(3) ආයෝජකයෙකු සමාගමක සාමාන්‍ය කොටස් මිලදී ගැනීමෙන් එහි අයිතිකරුවකු බවට පත් වේ.
(4) කොළඹ කොටස් වෙළෙඳපොළ, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගින් අධීක්ෂණය කරයි.

17. වැඩිවීම හර, අඩුවීම බැර යන ද්විත්ව සටහන් මූලධර්මය අදාළ වන ගිණුම් වර්ගය වන්නේ,
(1) වත්කම් ගිණුම් ය. (2) වගකීම් ගිණුම් ය.
(3) හිමිකම් ගිණුම් ය. (4) ආදායම් ගිණුම් ය.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රවිගේ ව්‍යාපාරයේ 2020 නොවැම්බර් 01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි වේ.

| වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 50 000 | | 35 000 | | 15 000 |

මෙම ව්‍යාපාරයේ 2020 නොවැම්බර් මස පළමු සතිය තුළ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A - රු. 10 000 ක බඩු තොගයක් ණයට ගැනීම
B - රු. 5 000 ක බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම
C - ණයහිමියෙකුට රු. 7 000 ක් ගෙවීම
D - රු. 5 000 කට මිලදී ගත් බඩු තොගයක් රු. 7 000 කට අත්පිට මුදලට විකිණීම

18. ඉහත ගනුදෙනුවලින් පසු මෙම ව්‍යාපාරයේ වගකීම්වල වටිනාකම කොපමණ ද?
(1) රු. 10 000 කි. (2) රු. 15 000 කි. (3) රු. 18 000 කි. (4) රු. 25 000 කි.

19. 2020.11.01 දිනට ව්‍යාපාරයේ පැවති මුළු වත්කම්වල අගය වෙනස් නොවන ගනුදෙනුව කුමක් ද?
(1) A (2) B (3) C (4) D

20. 2020 නොවැම්බර් මස පළමු සතිය අවසානයේදී ව්‍යාපාරයේ හිමිකම
(1) රු. 2 000 කින් වැඩිවේ. (2) රු. 7 000 කින් වැඩිවේ.
(3) රු. 2 000 කින් අඩුවේ. (4) රු. 5 000 කින් අඩුවේ.

21. ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනුවක බැර සටහන පහත දැක්වේ.

| | | |
|---|---|---|
| මුදල් ගිණුම | බැර | රු. 4 500 |
| ලද වට්ටම් ගිණුම | බැර | රු. 500 |

මෙම ගනුදෙනුව කුමක් ද?
(1) රු. 500 ක වට්ටමක් අඩු කර රු. 5 000 ක භාණ්ඩ අත්පිට මුදලට ගැනීම
(2) රු. 500 ක වට්ටමක් අඩු කර රු. 5 000 ක භාණ්ඩ ණයට ගැනීම
(3) 10% ක වට්ටමකට යටත්ව රු. 5 000 ක ණයහිමියෙකුට මුදල් ගෙවීම
(4) 10% ක වට්ටමකට යටත්ව රු. 5 000 ක ණයගැතියෙකුගෙන් මුදල් ලැබීම

22. ඇඳුම් මැසීමේ ව්‍යාපාරයකට මහන මැෂින් පහක් රු. 500 000 කට අත්පිට මුදලට ගැනීම සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ගැනුම් ඉන්වොයිසිය, ගැනුම් ජර්නලය (2) ගෙවීම් වවුචරය, මුදල් පොත
(3) ගෙවීම් වවුචරය, ගැනුම් ජර්නලය (4) ජර්නල් වවුචරය, පොදු ජර්නලය

23. රෙදිපිළි වෙළෙඳ ව්‍යාපාරයක පොදු ජර්නලයේ සටහන් කරන ගනුදෙනුව කුමක් ද?
(1) රු. 50 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම
(2) රු. 10 000 ක ණයහිමියෙකුට, මුදල් ගෙවීම
(3) රු. 2 000 ක් වූ අයිතිකරුගේ නිවසේ විදුලි බිල ව්‍යාපාරයේ මුදලින් ගෙවීම
(4) රු. 80 000 ක ඡායා පිටපත් යන්ත්‍රයක් ණයට ගැනීම

[හතරවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

24. ව්‍යාපාරයක 2020 දෙසැම්බර් මාසයේ සුළු මුදල් වියදම රු. 1 900 ක් විය. දෙසැම්බර් මාසය අවසානයේ සුළු මුදල් පොතේ ශේෂය රු. 100 කි. 2021 ජනවාරි මාසයේ සිට සුළු මුදල් අග්‍රිමය රු. 1 000 කින් වැඩි කිරීමට තීරණය කර ඇත. 2021.01.01 දිනට සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කළ යුතු වටිනාකම කොපමණ ද?

(1) රු. 1 000 (2) රු. 1 900 (3) රු. 2 900 (4) රු. 3 000

25. ව්‍යාපාරයක බැංකු ගිණුමේ සටහන් නොවූ, බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ගනුදෙනුව කුමක් ද?

(1) රු. 50 000 ක මුදලක් බැංකු ගිණුමේ තැන්පත් කිරීම
(2) සෘජුවම බැංකුවට රු. 5 000 ක ලාභාංශ ආදායමක් ලැබීම
(3) රු. 15 000 ක නිකුත් කළ චෙක්පතට බැංකුව විසින් මුදල් ගෙවීම
(4) රු. 20 000 ක තැන්පත් කළ චෙක්පත බැංකුව විසින් ගිණුමට බැර කිරීම

26. 2020 දෙසැම්බර් 01 දිනට බැංකු ප්‍රකාශනයේ වාසිදායක ශේෂය රු. 20 000 කි. මාසය තුළ බැංකුව විසින් සටහන් කළ ගනුදෙනු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 12/ 05 | තැන්පත් කළ චෙක්පත් | රු. 5 000 |
| 12/ 09 | ස්ථාවර නියෝග ගෙවීම් | රු. 8 000 |
| 12/ 15 | බැංකුවට ඉදිරිපත් කළ චෙක්පත් සඳහා ගෙවීම් | රු. 12 000 |
| 12/ 25 | ණයගැති ප්‍රේෂණ | රු. 10 000 |

2020 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය කොපමණ ද?

(1) රු. 13 000 (2) රු. 15 000 (3) රු. 22 000 (4) රු. 25 000

27. වෙළෙඳ ව්‍යාපාරයක් විසින් එකක් රු. 400 බැගින් කිරිපිටි පැකට් 50 ක් 10% ක වෙළෙඳ වට්ටමකට යටත්ව ණයට ගන්නා ලදී. මාසයකට පෙර මුදල් ගෙවන්නේ නම් 5% ක වට්ටමක් දෙනු ලැබේ. ගැනුම් ජර්නලයේ සටහන් කරන වටිනාකම කොපමණ ද?

(1) රු. 17 100 (2) රු. 18 000 (3) රු. 19 000 (4) රු. 20 000

28. ශේෂ පිරික්සුමේ හර සහ බැර තීරුවල එකතුව අසමාන වීමට බලපාන ගිණුම්කරණ වරද කුමක් ද?

(1) දුන් වට්ටම් රු. 500 ලද වට්ටම් ගිණුමට බැර කර, අදාළ ණයගැති ගිණුමට හර කර තිබීම
(2) රු. 12 000 ක ගැනුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම ගිණුම් පොත්වලින් මග හැරී තිබීම
(3) ලද ගෙවල් කුලී රු. 2 500 මුදල් ගිණුමේ නිවැරදිව සටහන් කර, ගෙවල් කුලී ගිණුමට හර කර තිබීම
(4) ණයට ගත් රු. 20 000 ක බඩු තොගය උපකරණ ගිණුමට හර කර, ණයහිමි ගිණුමට බැර කර තිබීම

29. ව්‍යාපාරයක පොදු ජර්නලයේ තබා තිබූ වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහනක් පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුම (හර) | 2 000 | |
| ලද වට්ටම් ගිණුම | | 2 000 |

සිදුවී ඇති ගිණුම්කරණ වරද වන්නේ,

(1) දුන් වට්ටම් රු. 2 000, ලද වට්ටම් ගිණුමට හර කර තිබීමයි.
(2) ලද වට්ටම් ගිණුමේ බැර පැත්ත රු. 2 000 ක් අඩුවෙන් එකතු කර තිබීමයි.
(3) ලද වට්ටම් ගිණුමේ ශේෂය රු. 2 000 ශේෂ පිරික්සුමට උපුටාගෙන නොතිබීමයි.
(4) ණයහිමියෙකුට මුදල් ගෙවීමේදී රු. 2 000 ක වට්ටමක් ලැබීම පොත්වල සටහන් නොවීමයි.


[පස්වැනි පිටුව බලන්න.

**30.** සුචරිත සමාජයේ 2020 දෙසැම්බර් 31 දිනට ලැබීම් හා ගෙවීම් ගිණුමේ ශේෂය රු. 15 000 ක් විය. නමුත් එදිනට අත ඉතිරි මුදල රු. 16 500 ක් බව එහි භාණ්ඩාගාරික පවසයි. මෙම වෙනසට හේතුව වන්නේ,

(1) පරණ පත්තර විකිණීමේ ආදායම රු. 1 500, දෙසැම්බර් 31 දින තෙක් ලැබී නොතිබීමයි.
(2) මුදලින් ගෙවූ කම්කරු කුලිය රු. 1 500, දෙසැම්බර් 31 දින තෙක් සටහන් කර නොමැති වීමයි.
(3) දෙසැම්බර් 31 දින තෙක් ගෙවා හෝ සටහන් කර නොමැති රු. 1 500 ක දුරකතන ගාස්තුවයි.
(4) මුදලින් ලැබී ඇති එහෙත් දෙසැම්බර් 31 දින තෙක් සටහන් කර නොමැති රු. 1 500 ක සාමාජික මුදල් ආදායමයි.

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **31** හා **32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පහත දැක්වෙන්නේ නිෂ්පාදන පිරිවැය මූලිකාංග දැක්වෙන සටහනකි.




මොරටු ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයේ පිරිවැය අයිතම කිහිපයක් පහත දැක්වේ.

A - දැව සඳහා පිරිවැය රු. 40 000
B - යන්ත්‍ර ක්ෂය රු. 5 000
C - වැලි කඩදාසි සහ පොලිෂ් වියදම් රු. 2 000
D - වඩු කාර්මිකයාගේ වැටුප රු. 30 000
E - විදුලි වියදම රු. 2 000

**31.** ඉහත සටහනේ අංක ① ස්ථානයට අදාළ වන මොරටු ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයේ පිරිවැය අයිතම වන්නේ,
(1) A සහ C ය. (2) A සහ D ය. (3) B සහ D ය. (4) C සහ D ය.

**32.** ඉහත සටහනේ අංක ② ස්ථානයට අදාළ වන මොරටු ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයේ පිරිවැය කොපමණ ද?
(1) රු. 2 000 (2) රු. 5 000 (3) රු. 7 000 (4) රු. 9 000

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **33** සහ **34** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුමුදුගේ ව්‍යාපාරය 2019.01.01 දින පිරිවැය රු. 950 000 කට මිලට ගත් ගොඩනැගිල්ල, මසකට රු. 20 000 බැගින් 2020.07.01 දින කුලියට දී, 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළ රු. 100 000 ක් ගොඩනැගිලි කුලී ලෙස ලබාගෙන ඇත. ගොඩනැගිල්ලේ ඵලදායී ජීව කාලය වර්ෂ 10 ක් ලෙස ද, සුන්බුන් අගය රු. 50 000 ක් ලෙස ද ඇස්තමේන්තු කර ඇත. ව්‍යාපාරයේ ගොඩනැගිලි සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.

**33.** 2020.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රු. 45 000 (2) රු. 90 000 (3) රු. 95 000 (4) රු. 180 000

**34.** ඉහත තොරතුරු සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) 2020.12.31 දිනට ගෙවිය යුතු ගොඩනැගිලි කුලී රු. 20 000 කි.
(2) 2020.12.31 දිනට ලැබිය යුතු ගොඩනැගිලි කුලී රු. 120 000 කි.
(3) 2020.12.31 දිනට ලැබිය යුතු ගොඩනැගිලි කුලී රු. 20 000 කි.
(4) 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ආදායම රු. 100 000 කි.

[හයවැනි පිටුව බලන්න.

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **35** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සමාධිගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට ශේෂ පිරික්සුමෙන් උපුටාගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| විකුණුම් | 600 000 |
| ගැනුම් | 350 000 |
| ගෙන ඒමේ කුලී | 1 000 |
| ලී බඩු (පිරිවැයට) | 50 000 |
| තොගය (2020.01.01 දිනට) | 20 000 |
| ණයගැතියෝ | 35 000 |
| විදුලි ගාස්තු | 15 000 |
| 10% බැංකු ණය | 600 000 |
| ප්‍රචාරණය | 32 000 |
| මුදල් ශේෂය | 7 000 |
| අමතර ආදායම් | 16 500 |
| ප්‍රාග්ධනය (2020.01.01 දිනට) | 400 000 |
| වැටුප් හා වේතන | 75 000 |
| ගැනිලි | 15 000 |

අමතර තොරතුරු :

1. 2020.12.31 දිනට ඉතිරි තොගය රු. 50 000 කි.
2. 2020.12.31 දිනට ගෙවිය යුතු වැටුප් හා වේතන රු. 15 000 කි.
3. ලී බඩු වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

**35.** සමාධිගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකිණීමට තිබූ තොගයේ පිරිවැය

(1) රු. 321 000 කි. (2) රු. 351 000 කි. (3) රු. 370 000 කි. (4) රු. 371 000 කි.

**36.** සමාධිගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය

(1) රු. 279 000 කි. (2) රු. 280 000 කි. (3) රු. 320 000 කි. (4) රු. 321 000 කි.

**37.** සමාධිගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම

(1) රු. 295 500 කි. (2) රු. 600 000 කි. (3) රු. 601 500 කි. (4) රු. 616 500 කි.

**38.** සමාධිගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බෙදාහැරීමේ වියදම්, පරිපාලන වියදම් සහ මූල්‍ය වියදම්වල වටිනාකම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රු. 33 000, රු. 95 000, රු. 60 000
(2) රු. 32 000, රු.110 000, රු.660 000
(3) රු. 32 000, රු.110 000, රු. 60 000
(4) රු.110 000, රු. 32 000, රු.660 000

**39.** සමාධිගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට මුළු ජංගම වගකීම්වල වටිනාකම

(1) රු. 15 000 කි. (2) රු. 60 000 කි. (3) රු. 75 000 කි. (4) රු. 675 000 කි.

**40.** සමාධිගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට මුළු ජංගම වත්කම්වල වටිනාකම

(1) රු. 45 000 කි. (2) රු. 50 000 කි. (3) රු. 92 000 කි. (4) රු. 142 000 කි.

* *

[හත්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

60 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවලදී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව **I** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

**1.** පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පරිසර කළමනාකරණය පිළිබඳ උපාධිධාරියෙකු වන සිරි, පියාට අයත් විශාල පුවක් වත්තේ පුවක් ගස්වලින් වැටෙන කොළපත්වලින් කෑම ඇසුරුම් පෙට්ටි සැකසීමට තීරණය කළේ ය. තම සොයුරිය වන ලක්මිණී ද සමඟ පුවක් වත්තේ වැටෙන කොළපත් එකතු කර, ඒවා සෝදා පිරිසිදු කර, වේලා, පදම්කොට කෑම ඇසුරුම් පෙට්ටි සකස් කිරීමේ ව්‍යාපාරයක් 'සිරිලක් නිෂ්පාදන' නමින් 2020 මාර්තු 01 දින ආරම්භ කර අවශ්‍ය සේවකයින් බඳවා ගන්නා ලදී. සිරි හා ලක්මිණී රු. 50 000 බැගින් යොදා ව්‍යාපාරය ආරම්භ කළ අතර, එදිනම සිරි සතුව තිබූ රු. 300 000 ක් වටිනා කුඩා ලොරි රථය ද ව්‍යාපාරයට යොදවන ලදී.

2020 මාර්තු මාසයේ කෑම ඇසුරුම් පෙට්ටි නිෂ්පාදනයට අදාළ ගනුදෙනු පහත දැක්වේ.

- කෑම ඇසුරුම් පෙට්ටි සකස් කිරීමේ, ඇලවීමේ හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය අත්පිට ගැනුම්.......... රු. 18 000
- කෑම ඇසුරුම් පෙට්ටි සකස් කරන්නාගේ මාසික වැටුප් ගෙවීම්.......... රු. 20 000
- මාර්තු මාසයේ විදුලි බිල්පත (මාර්තු 31 දින වන විට ගෙවා නොමැත.).......... රු. 4 000
- කෑම පෙට්ටි අච්චු සඳහා ගෙවූ පිරිවැය.......... රු. 30 000
- කෑම පෙට්ටි අච්චු මසකට රු. 1 000 බැගින් ක්ෂය කළ යුතු ය.

2020 මාර්තු මාසයේ නිෂ්පාදිත බෙදාහැරීමට අදාළ ගනුදෙනු පහත දැක්වේ.

- රියදුරු වැටුප් ගෙවීම් .......... රු. 30 000
- ලොරි රථයේ ඉන්ධන හා නඩත්තු වියදම් ගෙවීම් .......... රු. 20 000
- බෙදා හැරීමේ ලොරි රථය වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතු ය.

කෑම ඇසුරුම් පෙට්ටි සුපිරි වෙළෙඳසැල්වලට ණය පදනම මත බෙදා හරිනු ලැබේ. මාර්තු මාසයේ දී කෑම ඇසුරුම් පෙට්ටි 600 ක් නිෂ්පාදනය කර ඇති අතර, එක් ඇසුරුමක් රු. 200 බැගින් සියලුම කෑම ඇසුරුම් පෙට්ටි 10% ක වෙළෙඳ වට්ටමකට යටත්ව බෙදා හැර ඇත.

2020 මාර්තු 31 දිනට ඉතිරි කෑම ඇසුරුම් පෙට්ටි සකස් කිරීමේ, ඇලවීමේ හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය රු. 7 000 කි.

පොලිතින් හා ප්ලාස්ටික් කෑම ඇසුරුම් පෙට්ටි තහනම් කිරීමට රජය ගත් තීරණය සමග සිරිලක් නිෂ්පාදන සඳහා ඉල්ලුම ඉහළ යමින් පවතී.

(i) (අ) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(ආ) ඉහත (i) (අ) සඳහා ඔබ සඳහන් කළ මූලික මිනිස් අවශ්‍යතාව 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය විසින් සපුරාලන ආකාරය සඳහන් කරන්න.

[අටවැනි පිටුව බලන්න.

(ii) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය විසින් නිෂ්පාදනය කරනු ලබන කෑම ඇසුරුම් පෙට්ටිවලට අදාළව පහත සඳහන් නිෂ්පාදන සාධක සඳහා නිදසුන බැගින් ලියන්න. (පිළිතුරු සැපයීමට පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.)

| නිෂ්පාදන සාධකය | නිදසුන |
|---|---|
| 1. භූමිය | |
| 2. ප්‍රාග්ධනය | |

(iii) (අ) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරයේ ශක්තියක් සහ අවස්ථාවක් ලියන්න.
(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සඳහා නිදසුන් **දෙකක්** ලියන්න.

(iv) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය ඇසුරෙන්,
(අ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය වන 'නිෂ්පාදිතය' සහ 'මිල' සඳහා නිදසුන බැගින් ලියන්න.
(ආ) කළමනාකරණ කාර්ය වන 'සැලසුම්කරණය' සහ 'සංවිධානකරණය' සඳහා නිදසුන බැගින් ලියන්න.

(v) (අ) 2020 මාර්තු 01 දිනට 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරයේ ප්‍රාග්ධනය කොපමණ ද?
(ආ) 2020 මාර්තු 01 දිනට 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය සතු වත්කම් **දෙකක්** ලියන්න.

(vi) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරයේ 2020 මාර්තු මාසයේ විකුණුම් සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන වටිනාකම් සමග ලියන්න.

(vii) (අ) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය භාවිත කරන මූලික සටහන් පොතක් ලියන්න.
(ආ) ඉහත (vii) (අ) සඳහා ඔබ සඳහන් කළ මූලික සටහන් පොතේ ඇතුළත් කරන ගනුදෙනුවක් සිද්ධියෙන් උපුටා ලියන්න.

(viii) 2020 මාර්තු මාසයේ නිෂ්පාදනය කළ එක් කෑම ඇසුරුමක පිරිවැය ගණනය කරන්න.

(ix) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරයේ 2020 මාර්තු මාසයේ ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(x) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරයේ 2020 මාර්තු 31 දිනට මුළු හිමිකමේ වටිනාකම සහ මුළු වගකීම්වල වටිනාකම වෙන වෙනම ලියන්න.

**(ලකුණු 02 × 10 = 20 යි)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

2. (i) ඒක පුද්ගල ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.
(අ) මිනිස් අවශ්‍යතා සීමිත වන අතර මිනිස් වුවමනා සංකීර්ණ වේ.
(ආ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය තුළින් ව්‍යාපාර අවස්ථා හඳුනාගත හැකි ය.
(ඉ) නිෂ්පාදන ව්‍යාපාරයක ගොඩනැගිල්ල, නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් වේ.
(ඊ) ව්‍යාපාර සංවිධාන එහි හිමිකාරිත්වය අනුව ඒක පුද්ගල සහ හවුල් ව්‍යාපාර ලෙස වර්ග කර දක්වයි.
(ලකුණු 02 යි)

(iii) පහත දැක්වෙන්නේ 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුදත් සිදුකරනු ලැබූ කාර්ය දෙකකි.
1. මාර්ගගත (Online) ක්‍රමයට ව්‍යාපාර අධ්‍යයනය විෂයයට අදාළ පාඩමකට සහභාගී වීම
2. නැගණිය සමග ගිටාරය වාදනය කිරීම

ඉහත එකිනෙක කාර්යවලින් ගම්‍ය වන මිනිස් අවශ්‍යතාව සඳහන් කර, ඒවා සපුරාගෙන ඇති ආකාරය ලියන්න. (පිළිතුරු ලිවීම සඳහා පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.)

| මිනිස් අවශ්‍යතාව | එය සපුරාගෙන ඇති ආකාරය |
|---|---|
| 1. | |
| 2. | |

(ලකුණු 02 යි)

(iv) 'විකුම් රබර් නිපැයුම්' ව්‍යාපාරයේ හිමිකරු වික්‍රම, ඉහළ යන ඉල්ලුමට මුහුණ දීම සඳහා සිය ව්‍යාපාරය පුළුල් කිරීමේ අදහසින් බැංකු ණයක් අයදුම් කළ විට, දැන ගැනීමට හැකි වූයේ රජය විසින් වාර්ෂික බැංකු ණය පොලී අනුපාතය 12% සිට 8% දක්වා අඩුකර ඇති බවයි.
(අ) ඉහත සිද්ධිය තුළින් ගම්‍ය වන ව්‍යාපාර පරිසර සාධකය කුමක් ද?
(ආ) ඉහත සිද්ධියෙහි ඇතුළත් වන 'විකුම් රබර් නිපැයුම්' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව **දෙකක්** ලියන්න.
(ලකුණු 02 යි)
**(මුළු ලකුණු 08 යි)**

[නවවැනි පිටුව බලන්න.

3. (i) චෙක්පතක් ලිවීමේ දී සලකා බැලිය යුතු කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ණයපතක් හෝ හරපතක් ලබා ගැනීමට බැංකු ගිණුමක් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේ.

(ආ) සන්නිවේදනය තනි ක්‍රියාවක් නොව පොදු මූලිකාංග කිහිපයකින් සැකසී ඇති ක්‍රියාවලියකි.

(ඉ) ජීවිතයක් හෝ දේපලක් රක්ෂණය කිරීමට යම් පාර්ශ්වයකට ඇති අයිතිය උපරිම විශ්වාසයයි.

(ඊ) චෙක්පතක අණලදු සෑම විටම ජංගම ගිණුම් හිමියෙකු වේ. (ලකුණු 02 යි)

(iii) විශේෂ රැස්වීමක් මාර්තු 27 වන දින ප.ව. 3 ට පාසලේ දී පවත්වන බව දන්වා විදුහල්පතිතුමා සියලුම දෙමාපියන්ට ලිපි තැපැල් කරන ලදී.

(අ) ඉහත සිද්ධියේ සඳහන් වන, සන්නිවේදන මූලිකාංග **දෙකක්** ලියන්න.

(ආ) ඉහත (iii) (අ) සඳහා ඔබ සඳහන් කළ එක් එක් සන්නිවේදන මූලිකාංගය සඳහා නිදසුන බැගින් සිද්ධියෙන් උපුටා ලියන්න. (ලකුණු 02 යි)

(iv) කාර්යාල සේවා බස්රථ රියදුරෙකු වන සරත් සෑම දිනකම පෙ.ව. 5 ට මාතර බස් නැවතුම්පොළින් පිටත්ව අධිවේගී මාර්ගය ඔස්සේ පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ දක්වා ගමන් කරයි. 'පිටකොටුව ඉන්ධන පිරවුම්හලින්' බස් රථයට ඩීසල් ලබා ගන්නා සරත් එදිනම ප.ව. 5 ට මාතර බලා පිටත් වේ.

ප්‍රවාහන මූලිකාංග වන මාර්ගය, මාධ්‍ය, බලය සහ පර්යන්තය සඳහා නිදසුන් ඉහත සිද්ධිය ඇසුරෙන් වෙන වෙනම ලියන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි )**

4. (i) ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) කළමනාකරණ ක්‍රියාවලියේ ඉතා වැදගත්ම කළමනාකරණ කාර්යය මෙහෙයවීමයි.

(ආ) ව්‍යාපාරයක අලෙවිය වැඩිකර ගැනීම සඳහා යොදාගන්නා විවිධ උපක්‍රම අලෙවිකරණ මිශ්‍රයේ ප්‍රවර්ධනයයි.

(ඉ) ආයෝජනයක අවදානම සහ ප්‍රතිලාභය අතර සෘජු සම්බන්ධතාවක් පවතී.

(ඊ) සංස්ථාපිත සමාගම්වල කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීමට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලබයි. (ලකුණු 02 යි)

(iii) 'අමරස නිපැයුම්' ව්‍යාපාරය විසින් නිෂ්පාදනය කරනු ලැබූ 'කොස් ඇට පිටි' හඳුන්වාදීමේ කටයුතු ඉතා සාර්ථකව සිදුවිය. ඒ සඳහා අනුගමනය කළ පියවර කිහිපයක් පහත දැක්වේ.

A - කොස් ඇට පිටි පැකට්ටුවේ ඇසුරුම පරිසර හිතකාමී ලෙස සකස් කිරීමට තීරණය කිරීම

B - පළමු මාසයේ විකුණුම් වාර්තා විශ්ලේෂණය කිරීමෙන් පසු විකුණුම් මිල මත 2% ක වට්ටමක් ලබා දීම

C - සෘජු බෙදාහැරීම් කටයුතු සඳහා විකුණුම් සේවකයින් බඳවා ගැනීම

ඉහත එක් එක් පියවරෙහි සඳහන් වන කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යය සහ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය ලියන්න. (පිළිතුරු සැපයීම සඳහා පහත ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න. පළමු පියවර (A) සටහන් කර දක්වා ඇත.)

| පියවර | කළමනාකරණ කාර්යය | අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යය |
|---|---|---|
| A | සැලසුම්කරණය | නිෂ්පාදිතය |
| B | | |
| C | | |

(ලකුණු 02 යි)

(iv) රුවන් තම රු. 500 000 ක විශ්‍රාම පාරිතෝෂිකය ස්ථාවර තැන්පතුවක ද, නුවන් තම රු. 500 000 ක විශ්‍රාම පාරිතෝෂිකය කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ද ආයෝජනය කරන ලදී. වසරක් අවසානයේ රුවන්ට රු. 40 000 ක් ද, නුවන්ට රු. 75 000 ක් ද ප්‍රතිලාභ ලෙස හිමි විය.

(අ) ඉහත සිද්ධියේ රුවන් සහ නුවන් ලද ප්‍රතිලාභ හඳුන්වන පද වෙන වෙන ම ලියන්න.

(ආ) සමාන මුදලක්, සමාන කාල පරිච්ඡේදයක් සඳහා ආයෝජනය කළ ද, රුවන්ට වඩා වැඩි ප්‍රතිලාභයක් නුවන්ට ලැබීමට හේතුව කුමක් ද?

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

/දහවැනි පිටුව බලන්න.

6. (i) මුදල් පොත තුළින් ඉටු කරන කාර්ය දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) සපත්තු නිෂ්පාදන ව්‍යාපාරයක නුපුහුණු ගිණුම් ලිපිකරුවකු විසින් 2020 සැප්තැම්බර් මාසය සඳහා පිළියෙල කළ නිෂ්පාදන පිරිවැය ලේඛනය පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| සම් සඳහා පිරිවැය | 30 000 |
| සපත්තු සකසන්නාගේ වැටුප | 15 000 |
| කර්මාන්ත ශාලාවේ කුලිය | 30 000 |
| ප්‍රචාරණය | 10 000 |
| සපත්තු ඇලවීමේ ද්‍රව්‍ය | 5 000 |
| බෙදාහැරීමේ ලොරි රථ රියදුරාගේ වැටුප | 10 000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | 100 000 |

- නිෂ්පාදනය කළ සපත්තු කුට්ටම් ගණන 200 කි.

සපත්තු කුට්ටමක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(iii) කසුන්ගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව සමාන නොවී ය. වෙනසට හේතු පහත දැක්වේ.

- ගෙවූ විදුලි ගාස්තු රු. 7000 මුදල් පොතේ නිවැරදිව සටහන් කර විදුලි ගාස්තු ගිණුමට රු. 700 ක් ලෙස හර කිරීම
- විකුණුම් ගිණුමේ බැර පැත්ත රු. 2000 ක් අඩුවෙන් එකතු වී තිබීම
- යන්ත්‍ර අලුත්වැඩියා වියදම් රු. 15 000 යන්ත්‍ර ගිණුමට හර කර තිබීම
- ලද වට්ටම් ගිණුමේ ශේෂය වූ රු. 2 300 ශේෂ පිරික්සුමට උපුටාගෙන නොතිබීම

අවශ්‍ය වන්නේ:

(අ) අවිනිශ්චිත ගිණුම

(ආ) 2020.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙහි අවිනිශ්චිත ගිණුමේ ශේෂය පැවතියේ කුමන තීරුවේ ද යන්න සඳහන් කිරීම (ලකුණු 04 යි)

(iv) පහත දැක්වෙන්නේ සිරිමල්ගේ ව්‍යාපාරයේ 2020 දෙසැම්බර් මාසයේ බැංකු ගිණුම හා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයයි.

බැංකු ගිණුම

| දිනය | ලදු අං. | විස්තරය | ස.පි | වටිනාකම (රු.) | දිනය | චෙවු. අං. | විස්තරය | ස.පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 12.01 | | ශේෂය ඉ/ගෙ | | 22 000 | 12.05 | | ගැනුම් (812301) | | 20 000 |
| 12.08 | | චෙක් තැන්පත් (711322) | | 15 500 | 12.10 | | ණයහිමි (812302) | | 3 000 |
| | | | | | 12.16 | | වේතන (812303) | | 24 000 |
| 12.10 | | මුදල් තැන්පත් | | 25 000 | 12.26 | | කඩකුලී (812304) | | 5 000 |
| 12.28 | | චෙක් තැන්පත් (100100) | | 12 000 | 12.31 | | ශේෂය ප/ගෙ | | 22 500 |
| | | | | 74 500 | | | | | 74 500 |

බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 12.01 | ශේෂය ඉ/ගෙ | | | 22 000 |
| 12.07 | චෙක් (812301) | 20 000 | | 2 000 |
| 12.10 | චෙක් තැන්පත් | | 15 500 | 17 500 |
| 12.10 | චෙක් (812302) | 3 000 | | 14 500 |
| 12.10 | මුදල් | | 25 000 | 39 500 |
| 12.20 | චෙක් (812303) | 24 000 | | 15 500 |
| 12.23 | ස්ථාවර නියෝග ගෙවීම් (රක්ෂණ ගාස්තු) | 2 000 | | 13 500 |
| 12.30 | බැංකු ගාස්තු | 1 000 | | 12 500 |

[දොළොස්වැනි පිටුව බලන්න.

6. (i) මුදල් පොත තුළින් ඉටු කරන කාර්ය දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) සපත්තු නිෂ්පාදන ව්‍යාපාරයක නුපුහුණු ගිණුම් ලිපිකරුවකු විසින් 2020 සැප්තැම්බර් මාසය සඳහා පිළියෙල කළ නිෂ්පාදන පිරිවැය ලේඛනය පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| සම් සඳහා පිරිවැය | 30 000 |
| සපත්තු සකසන්නාගේ වැටුප | 15 000 |
| කර්මාන්ත ශාලාවේ කුලිය | 30 000 |
| ප්‍රචාරණය | 10 000 |
| සපත්තු ඇලවීමේ ද්‍රව්‍ය | 5 000 |
| බෙදාහැරීමේ ලොරි රථ රියදුරාගේ වැටුප | 10 000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | 100 000 |

- නිෂ්පාදනය කළ සපත්තු කුට්ටම් ගණන 200 කි.

සපත්තු කුට්ටමක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(iii) කසුන්ගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව සමාන නොවී ය. වෙනසට හේතු පහත දැක්වේ.

- ගෙවූ විදුලි ගාස්තු රු. 7000 මුදල් පොතේ නිවැරදිව සටහන් කර විදුලි ගාස්තු ගිණුමට රු. 700 ක් ලෙස හර කිරීම
- විකුණුම් ගිණුමේ බැර පැත්ත රු. 2000 ක් අඩුවෙන් එකතු වී තිබීම
- යන්ත්‍ර අලුත්වැඩියා වියදම් රු. 15000 යන්ත්‍ර ගිණුමට හර කර තිබීම
- ලද වට්ටම් ගිණුමේ ශේෂය වූ රු. 2300 ශේෂ පිරික්සුමට උපුටාගෙන නොතිබීම

අවශ්‍ය වන්නේ:

(අ) අවිනිශ්චිත ගිණුම

(ආ) 2020.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙහි අවිනිශ්චිත ගිණුමේ ශේෂය පැවතියේ කුමන තීරුවේ ද යන්න සඳහන් කිරීම (ලකුණු 04 යි)

(iv) පහත දැක්වෙන්නේ සිරිමල්ගේ ව්‍යාපාරයේ 2020 දෙසැම්බර් මාසයේ බැංකු ගිණුම හා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයයි.

බැංකු ගිණුම

| දිනය | ලදු අං. | විස්තරය | ස.පි | වටිනාකම (රු.) | දිනය | චවු. අං. | විස්තරය | ස.පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 12.01 | | ශේෂය ඉ/ගෙ | | 22 000 | 12.05 | | ගැනුම් (812301) | | 20 000 |
| 12.08 | | ් තැන්පත් 322) | | 15 500 | 12.10 | | ණයහිමි (812302) | | 3 000 |
| | | | | | 12.16 | | වේතන (812303) | | 24 000 |
| 12.10 | | ුදල් තැන්පත් | | 25 000 | 12.26 | | කඩකුලී (812304) | | 5 000 |
| 12.28 | | චෙක් තැන්පත් (100100) | | 12 000 | 12.31 | | ශේෂය ප/ගෙ | | 22 500 |
| | | | | 74 500 | | | | | 74 500 |

බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 12.01 | ශේෂය ඉ/ගෙ | | | 22 000 |
| 12.07 | චෙක් (812301) | 20 000 | | 2 000 |
| 12.10 | චෙක් තැන්පත් | | 15 500 | 17 500 |
| 12.10 | චෙක් (812302) | 3 000 | | 14 500 |
| 12.10 | මුදල් | | 25 000 | 39 500 |
| 12.20 | චෙක් (812303) | 24 000 | | 15 500 |
| 12.23 | ස්ථාවර නියෝග ගෙවීම් (රක්ෂණ ගාස්තු) | 2 000 | | 13 500 |
| 12.30 | බැංකු ගාස්තු | 1 000 | | 12 500 |

[දොළොස්වැනි පිටුව බලන්න.

අවශ්‍ය වන්නේ:

(අ) සිරිමල්ගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ ශේෂය අසමාන වීමට හේතු ලිවීම

(ආ) සිරිමල්ගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

7. (i) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ලැබීම් හා ගෙවීම් ගිණුම සහ ආදායම් ප්‍රකාශනය අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) රන්තරු ළමා සමාජයේ සාමාජික සංඛ්‍යාව 50 කි. එක් සාමාජිකයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 100 කි. 2020.12.31 දිනෙන් අවසන් වර්ෂයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| 2020 වර්ෂයේ දී ලැබුණු සාමාජික මුදල ............................ | 40 000 |
| පරණ පුවත්පත් අලෙවියෙන් ලද මුදල ............................ | 500 |
| විදුලි බිල ගෙවීම............................................ | 12 000 |
| සංග්‍රහ වියදම් ගෙවීම ........................................ | 1 500 |
| ලී බඩු මිලදී ගැනීම සඳහා ගෙවීම ............................ | 100 000 |
| වෙනත් වියදම් ගෙවීම........................................ | 2 500 |

- ලී බඩු වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලැබේ.

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රන්තරු ළමා සමාජයේ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න. (ලකුණු 02 යි)

(iii) සිත්මිණගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2020.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| 2020.01.01 දිනට තොගය ........................ | 28 000 | |
| ගැනුම් ........................................ | 350 000 | |
| ගෙන ඒමේ කුලී.................................. | 1 500 | |
| විකුණුම් ...................................... | | 480 000 |
| ණයගැතියෝ .................................... | 37 000 | |
| ණයහිමියෝ .................................... | | 50 000 |
| ආයෝජන ...................................... | 50 000 | |
| විදුලි ගාස්තු ................................ | 25 000 | |
| මුදල් ශේෂය.................................... | 40 000 | |
| බැංකු ශේෂය .................................. | | 12 000 |
| දුන් වට්ටම් .................................. | 1 200 | |
| ලද වට්ටම් .................................... | | 2 700 |
| ඉඩම් සහ ගොඩනැගිලි (පිරිවැයට) .............. | 400 000 | |
| ප්‍රචාරණ වියදම් .............................. | 20 000 | |
| 8% බැංකු ණය .................................. | | 100 000 |
| ප්‍රාග්ධනය .................................... | | 308 000 |
| | 952 700 | 952 700 |

අතිරේක තොරතුරු:

- 2020.12.31 දිනට ඉතිරි තොගය රු. 32 000 කි.
- 2020.12.31 දිනට ණයගැතියන්ගෙන් රු. 2 000 ක් බොල් ණය ලෙස කපා හරින ලදී.
- ලැබිය යුතු ආයෝජන ආදායම රු. 5 000 කි.

අවශ්‍ය වන්නේ:

(අ) 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04 යි)

(ආ) 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි
அந்தரங்கமானது

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
# க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2020

විෂයය අංකය / பாட இலக்கம்: **60**

විෂයය / பாடம்: **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 3 | 31. | 2 |
| 02. | 3 | 12. | 2 | 22. | 2 | 32. | 3 |
| 03. | 4 | 13. | 4 | 23. | 4 | 33. | 2 |
| 04. | 3 | 14. | 3 | 24. | 3 | 34. | 3 |
| 05. | 1 | 15. | 1 | 25. | 2 | 35. | 4 |
| 06. | 1 | 16. | 2 | 26. | 2 | 36. | 1 |
| 07. | 2 | 17. | 1 | 27. | 2 | 37. | 4 |
| 08. | 4 | 18. | 3 | 28. | 3 | 38. | 3 |
| 09. | 2 | 19. | 2 | 29. | 2 | 39. | 3 |
| 10. | 3 | 20. | 1 | 30. | 4 | 40. | 3 |

PADANAMA PUBLICATION

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: **25 / 40**

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: **25 / 40**

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020

## 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## II පත්‍රය

### ලකුණු දීමේ පටිපාටිය

---

**1.** පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පරිසර කළමනාකරණය පිළිබඳ උපාධිධාරියෙකු වන සිරි, පියාට අයත් විශාල පුවක් වත්තේ පුවක් ගස්වලින් වැටෙන කොළපත්වලින් කෑම ඇසුරුම් පෙට්ටි සැකසීමට තීරණය කළේ ය. තම සොයුරිය වන ලක්මිණී ද සමග පුවක් වත්තේ වැටෙන කොළපත් එකතු කර, ඒවා සෝදා පිරිසිදු කර, වේලා, පදම්කොට කෑම ඇසුරුම් පෙට්ටි සකස් කිරීමේ ව්‍යාපාරයක් 'සිරිලක් නිෂ්පාදන' නමින් 2020 මාර්තු 01 දින ආරම්භ කර අවශ්‍ය සේවකයින් බඳවා ගන්නා ලදී. සිරි හා ලක්මිණී රු. 50 000 බැගින් යොදා ව්‍යාපාරය ආරම්භ කළ අතර, එදිනම සිරි සතුව තිබූ රු. 300 000 ක් වටිනා කුඩා ලොරි රථය ද ව්‍යාපාරයට යොදවන ලදී.

2020 මාර්තු මාසයේ කෑම ඇසුරුම් පෙට්ටි නිෂ්පාදනයට අදාළ ගනුදෙනු පහත දැක්වේ.

- කෑම ඇසුරුම් පෙට්ටි සකස් කිරීමේ, ඇලවීමේ හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය අත්පිට ගැනුම්.......... රු. 18 000
- කෑම ඇසුරුම් පෙට්ටි සකස් කරන්නාගේ මාසික වැටුප් ගෙවීම්.............................. රු. 20 000
- මාර්තු මාසයේ විදුලි බිල්පත (මාර්තු 31 දින වන විට ගෙවා නොමැත.)...................... රු. 4 000
- කෑම පෙට්ටි අච්චු සඳහා ගෙවූ පිරිවැය................................................ රු. 30 000
- කෑම පෙට්ටි අච්චු මසකට රු. 1 000 බැගින් ක්ෂය කළ යුතු ය.

2020 මාර්තු මාසයේ නිෂ්පාදිත බෙදාහැරීමට අදාළ ගනුදෙනු පහත දැක්වේ.

- රියදුරු වැටුප් ගෙවීම් ........................................................ රු. 30 000
- ලොරි රථයේ ඉන්ධන හා නඩත්තු වියදම් ගෙවීම් ........................................ රු. 20 000
- බෙදා හැරීමේ ලොරි රථය වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතු ය.

කෑම ඇසුරුම් පෙට්ටි සුපිරි වෙළෙඳසැල්වලට ණය පදනම මත බෙදා හරිනු ලැබේ. මාර්තු මාසයේ දී කෑම ඇසුරුම් පෙට්ටි 600 ක් නිෂ්පාදනය කර ඇති අතර, එක් ඇසුරුමක් රු. 200 බැගින් සියලුම කෑම ඇසුරුම් පෙට්ටි 10% ක වෙළෙඳ වට්ටමකට යටත්ව බෙදා හැර ඇත.

2020 මාර්තු 31 දිනට ඉතිරි කෑම ඇසුරුම් පෙට්ටි සකස් කිරීමේ, ඇලවීමේ හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය රු. 7 000 කි.

පොලිතින් හා ප්ලාස්ටික් කෑම ඇසුරුම් පෙට්ටි තහනම් කිරීමට රජය ගත් තීරණය සමග සිරිලක් නිෂ්පාදන සඳහා ඉල්ලුම ඉහළ යමින් පවතී.

(i) (අ) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(ආ) ඉහත (i) (අ) සඳහා ඔබ සඳහන් කළ මූලික මිනිස් අවශ්‍යතාව 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය විසින් සපුරාලන ආකාරය සඳහන් කරන්න.

(ii) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය විසින් නිෂ්පාදනය කරනු ලබන කෑම ඇසුරුම් පෙට්ටිවලට අදාළව පහත සඳහන් නිෂ්පාදන සාධක සඳහා නිදසුන බැගින් ලියන්න. (පිළිතුරු සැපයීමට පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.)

| නිෂ්පාදන සාධකය | නිදසුන |
|---|---|
| 1. භූමිය | |
| 2. ප්‍රාග්ධනය | |

(iii) (අ) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරයේ ශක්තියක් සහ අවස්ථාවක් ලියන්න.

(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සඳහා නිදසුන් **දෙකක්** ලියන්න.

(iv) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය ඇසුරෙන්,

(අ) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය වන 'නිෂ්පාදිතය' සහ 'මිල' සඳහා නිදසුන බැගින් ලියන්න.

(ආ) කළමනාකරණ කාර්ය වන 'සැලසුම්කරණය' සහ 'සංවිධානකරණය' සඳහා නිදසුන බැගින් ලියන්න.

(v) (අ) 2020 මාර්තු 01 දිනට 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරයේ ප්‍රාග්ධනය කොපමණ ද?
(ආ) 2020 මාර්තු 01 දිනට 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය සතු වත්කම් **දෙකක්** ලියන්න.

(vi) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරයේ 2020 මාර්තු මාසයේ විකුණුම් සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන වටිනාකම් සමග ලියන්න.

(vii) (අ) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරය භාවිත කරන මූලික සටහන් පොතක් ලියන්න.
(ආ) ඉහත (vii) (අ) සඳහා ඔබ සඳහන් කළ මූලික සටහන් පොතේ ඇතුළත් කරන ගනුදෙනුවක් සිද්ධියෙන් උපුටා ලියන්න.

(viii) 2020 මාර්තු මාසයේ නිෂ්පාදනය කළ එක් කෑම ඇසුරුමක පිරිවැය ගණනය කරන්න.

(ix) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරයේ 2020 මාර්තු මාසයේ ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(x) 'සිරිලක් නිෂ්පාදන' ව්‍යාපාරයේ 2020 මාර්තු 31 දිනට මුළු හිමිකමේ වටිනාකම සහ මුළු වගකීම්වල වටිනාකම වෙන වෙනම ලියන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

**1.** (i) (අ) ආහාර *(ලකුණු 01 යි)*

(ආ) කෑම ඇසුරුම් පෙට්ටි නිෂ්පාදනය කිරීම *(ලකුණු 01 යි)*

(ii)

| **නිෂ්පාදන සාධකය** | **නිදසුන** |
|---|---|
| 1. භූමිය | කොළපත් |
| 2. ප්‍රාග්ධනය | • කෑම ඇසුරුම් පෙට්ටි සකස් කිරීමේ ඇලවීමේ හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය<br>• මුදල්<br>• කෑම පෙට්ටි අච්චු |

*(01 × 02 = ලකුණු 02 යි)*

(iii) (අ) **ශක්තිය**

- සිරි පරිසර කළමනාකරණය පිළිබඳ උපාධිධාරියෙකු වීම
- අයිතිකරුවන් සතුව හොඳ මූල්‍ය ශක්තියක් තිබීම

**අවස්ථා**

- පියා සතුව විශාල පුවක් වත්තක් තිබීම
- පොලිතීන් හා ප්ලාස්ටික් කෑම ඇසුරුම් පෙට්ටි තහනම් කිරීමට රජය තීරණය කිරීම

*(½ × 02 = ලකුණු 01 යි )*

(ආ)
- සිරිලක් නිෂ්පාදන ව්‍යාපාරය
- සුපිරි වෙළෙඳසැල්

*(½ × 02 = ලකුණු 01 යි )*

(iv) (අ) නිෂ්පාදිතය - කෑම ඇසුරුම් පෙට්ටිය

මිල - ඒකක මිල රු. 200

- වෙළෙඳ වට්ටම 10%

*(½ × 02 = ලකුණු 01 යි )*

(ආ) සැළසුම්කරණය - කෑම ඇසුරුම් පෙට්ටි සැකසීමට තීරණය කිරීම

සංවිධානකරණය - අවශ්‍ය සේවකයින් බඳවා ගැනීම

- කෑම පෙට්ටි අච්චු මිලදී ගැනීම
- සකස් කිරීමේ, ඇලවීමේ හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය ලබා ගැනීම
- ව්‍යාපාරයට ලොරි රථයක් යෙදවීම

*(½ × 02 = ලකුණු 01 යි )*

(v) (අ) රු. 400 000

***හෝ***

රු. 50 000 + රු. 50 000 + රු. 300 000 = රු. 400 000

*(ලකුණු 01 යි)*

(ආ)
- මුදල්
- ලොරි රථය

(½ × 02 = ලකුණු 01 යි )

(vi) ණයගැති ගිණුම හර රු. 108 000

විකුණුම් ගිණුම බැර රු. 108 000

*(ලකුණු 02 යි)*

(vii) (අ)
- මුදල් පොත
- පොදු ජර්නලය
- විකුණුම් ජර්නලය

*(01 × 01 = ලකුණු 01 යි )*

(ආ) **මුදල් පොත**

- ප්‍රාග්ධනය යෙදවීම රු. 100 000
- අත්පිට ගැණුම් රු. 18 000
- ගෙවූ වැටුප් රු. 50 000
- කෑම පෙට්ටි අච්චු ගැණුම් රු. 30 000
- ඉන්ධන හා නඩත්තු වියදම් රු. 20 000

**පොදු ජර්නලය**

- සිරි රු. 300 000 ක ලොරි රථය ව්‍යාපාරයට යෙදවීම.
- උපචිත විදුලි ගාස්තුව රු. 4 000
- කෑම පෙට්ටි අච්චු ක්ෂය රු. 1 000
- ලොරි රථ ක්ෂය රු. 5 000

**විකුණුම් ජර්නලය**

- ණයට විකුණුම් රු. 108 000

*(01 × 01 = ලකුණු 01 යි )*

(viii)

| | රු. |
|---|---|
| ද්‍රව්‍ය පිරිවැය | 11 000 |
| වැටුප් | 20 000 |
| විදුලි ගාස්තු | 4 000 |
| අච්චු ක්ෂය | 1 000 |
| නිෂ්පාදන පිරිවැය | 36 000 |

එක් ඇසුරුමක පිරිවැය $\frac{36\,000}{600}$ (½) (½)

= රු. 60 (01)

(ලකුණු 02 යි)

**හෝ**

✶

ඉතිරි කෑම ඇසුරුම් පෙට්ටි සකස් කිරීමේ, ඇලවීමේ හා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය රු. 7 000 නොසලකන ලද පිළිතුර -

| | (රු) | (රු) |
|---|---|---|
| ද්‍රව්‍ය පිරිවැය | 18 000 | |
| වැටුප් | 20 000 | |
| විදුලි ගාස්තු | 4 000 | |
| අච්චු ක්ෂය | 1 000 | |
| නිෂ්පාදන පිරිවැය | 43 000 | |
| එක් ඇසුරුමක පිරිවැය | = | $\frac{43\,000}{600}$ (½) (½) |
| | = | රු 71.66 (01) |

(ලකුණු 02 යි)

(ix)

**ශුද්ධ ලාභය ගණනය කිරීමේ ලේඛනය**

| | (රු) | (රු) | |
|---|---|---|---|
| විකුණුම් | | 108 000 | (½) |
| නිෂ්පාදන පිරිවැය | 36 000 | | (01) |
| රියදුරු වැටුප් | 30 000 | | |
| ඉන්ධන හා නඩත්තු වියදම | 20 000 | | |
| ලොරි රථ ක්ෂය | 5 000 | | |
| | | (91 000) | |
| ශුද්ධ ලාභය | | **17 000** | (½) |

(ලකුණු 02 යි)

**හෝ**

★ **ශුද්ධ ලාභය ගණනය කිරීමේ ලේඛනය**

| | (රු) | (රු) | |
|---|---|---|---|
| විකුණුම් | | 108 000 | (½) |
| නිෂ්පාදන පිරිවැය | 43 000 | | (01) |
| රියදුරු වැටුප් | 30 000 | | |
| ඉන්ධන හා නඩත්තු වියදම | 20 000 | | |
| ලොරි රථ ක්ෂය | 5 000 | | |
| | | (98 000) | |
| ශුද්ධ ලාභය | | **10 000** | (½) |

(ලකුණු 02 යි)

(x) 2020.03.31 දිනට මුළු හිමිකම

රු. 400 000 + රු. 17 000 = රු. 417 000

හෝ

★ රු. 400 000 + රු. 10 000 = රු. 410 000

*(ලකුණු 01 යි)*

2020.03.31 දිනට මුළු වගකීම් රු. 4 000

*(ලකුණු 01 යි)*

| 01 | (i) | (ii) | (iii) | (iv) | (v) | (vi) | (vii) | (viii) | (ix) | (x) | — |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | |

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**2.** (i) ඒක පුද්ගල ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) මිනිස් අවශ්‍යතා සීමිත වන අතර මිනිස් වුවමනා සංකීර්ණ වේ.

(ආ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය තුළින් ව්‍යාපාර අවස්ථා හඳුනාගත හැකි ය.

(ඉ) නිෂ්පාදන ව්‍යාපාරයක ගොඩනැගිල්ල, නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් වේ.

(ඊ) ව්‍යාපාර සංවිධාන එහි හිමිකාරිත්වය අනුව ඒක පුද්ගල සහ හවුල් ව්‍යාපාර ලෙස වර්ග කර දක්වයි. (ලකුණු 02 යි)

(iii) පහත දැක්වෙන්නේ 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුදත් සිදුකරනු ලැබූ කාර්ය දෙකකි.

1. මාර්ගගත (Online) ක්‍රමයට ව්‍යාපාර අධ්‍යයනය විෂයයට අදාළ පාඩමකට සහභාගී වීම
2. නැගණිය සමඟ ගිටාරය වාදනය කිරීම

ඉහත එකිනෙක කාර්යවලින් ගම්‍ය වන මිනිස් අවශ්‍යතාව සඳහන් කර, ඒවා සපුරාගෙන ඇති ආකාරය ලියන්න. (පිළිතුරු ලිවීම සඳහා පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.)

| මිනිස් අවශ්‍යතාව | එය සපුරාගෙන ඇති ආකාරය |
|---|---|
| 1. | |
| 2. | |

(ලකුණු 02 යි)

(iv) 'විකුම් රබර් නිපැයුම්' ව්‍යාපාරයේ හිමිකරු විකුම, ඉහළ යන ඉල්ලුමට මුහුණ දීම සඳහා සිය ව්‍යාපාරය පුළුල් කිරීමේ අදහසින් බැංකු ණයක් අයදුම් කළ විට, දැන ගැනීමට හැකි වූයේ රජය විසින් වාර්ෂික බැංකු ණය පොලී අනුපාතය 12% සිට 8% දක්වා අඩුකර ඇති බවයි.

(අ) ඉහත සිද්ධිය තුළින් ගම්‍ය වන ව්‍යාපාර පරිසර සාධකය කුමක් ද?

(ආ) ඉහත සිද්ධියෙහි ඇතුළත් වන 'විකුම් රබර් නිපැයුම්' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**2.** (i)

- ප්‍රාග්ධනය අයිතිකරු වන තනි පුද්ගලයෙකු විසින් යෙදවීම
- ලාභය හෝ අලාභය තනිව භුක්ති විඳීම
- අයිතිකරුගේ වගකීම අසීමිත වීම
- නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
- ලියාපදිංචිය අනිවාර්ය නොවීම

*(01 × 02 = ලකුණු 02 යි)*

(ii)

(අ) සත්‍යයි

(ආ) අසත්‍යයි

(ඉ) අසත්‍යයි

(ඊ) අසත්‍යයි

(½ × 04 = ලකුණු 02 යි)

(iii)

| මිනිස් අවශ්‍යතාව | එය සපුරාගෙන ඇති ආකාරය |
|---|---|
| 1. අධ්‍යාපනය | මාර්ගගත ක්‍රමයට පාඩමකට සහභාගි වීම |
| 2. විනෝදය | සහෝදරිය සමඟ ගිටාරය වාදනය කිරීම |

(½ × 04 = ලකුණු 02 යි)

(iv) (අ) ආර්ථික පරිසරය *(ලකුණු 01 යි)*

(ආ)
- අයිතිකරු / වික්‍රම
- රජය
- බැංකු / මූල්‍යායතන

**(½ × 02 = ලකුණු 01 යි)**

| 02 | (i) | (ii) | | | | (iii) | | (iv) | | — |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අ | ආ | ඉ | ඊ | 1 | 2 | අ | ආ | |
| | 02 | ½ | ½ | ½ | ½ | 01 | 01 | 01 | 01 | |

**3.** (i) චෙක්පතක් ලිවීමේ දී සලකා බැලිය යුතු කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ණයපතක් හෝ හරපතක් ලබා ගැනීමට බැංකු ගිණුමක් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේ.

(ආ) සන්නිවේදනය තනි ක්‍රියාවක් නොව පොදු මූලිකාංග කිහිපයකින් සැකසී ඇති ක්‍රියාවලියකි.

(ඉ) ජීවිතයක් හෝ දේපලක් රක්ෂණය කිරීමට යම් පාර්ශ්වයකට ඇති අයිතිය උපරිම විශ්වාසයයි.

(ඊ) චෙක්පතක අණලදු සෑම විටම ජංගම ගිණුම් හිමියෙකු වේ. (ලකුණු 02 යි)

(iii) විශේෂ රැස්වීමක් මාර්තු 27 වන දින ප.ව. 3 ට පාසලේ දී පවත්වන බව දන්වා විදුහල්පතිතුමා සියලුම දෙමාපියන්ට ලිපි තැපැල් කරන ලදී.

(අ) ඉහත සිද්ධියේ සඳහන් වන, සන්නිවේදන මූලිකාංග **දෙකක්** ලියන්න.

(ආ) ඉහත (iii) (අ) සඳහා ඔබ සඳහන් කළ එක් එක් සන්නිවේදන මූලිකාංගය සඳහා නිදසුන බැගින් සිද්ධියෙන් උපුටා ලියන්න. (ලකුණු 02 යි)

(iv) කාර්යාල සේවා බස්රථ රියදුරෙකු වන සරත් සෑම දිනකම පෙ.ව. 5 ට මාතර බස් නැවතුම්පොළින් පිටත්ව අධිවේගී මාර්ගය ඔස්සේ පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ දක්වා ගමන් කරයි. 'පිටකොටුව ඉන්ධන පිරවුම්හලින්' බස් රථයට ඩීසල් ලබා ගන්නා සරත් එදිනම ප.ව. 5 ට මාතර බලා පිටත් වේ.

ප්‍රවාහන මූලිකාංග වන මාර්ගය, මාධ්‍ය, බලය සහ පර්යන්තය සඳහා නිදසුන් ඉහත සිද්ධිය ඇසුරෙන් වෙන වෙනම ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

**3.**

(i)
- නිවැරදිව දිනය යෙදීම
- ආදායකයාගේ නම පැහැදිළි අකුරෙන් නිවැරදිව ලිවීම
- ඉලක්කමෙන් හා අකුරෙන් ලියන වටිනාකම නිවැරදි වීම
- ඇණකරුගේ අත්සන නිවැරදිව යෙදීම
- චෙක්පතෙහි සංශෝධන ඇත්නම් ඒවා පැහැදිලිව නිවැරදි කර සම්පූර්ණ අත්සන් මගින් සනාථ කළයුතු වීම
- පිළිපතෙහි අදාළ තොරතුරු සඳහන් කිරීම
- චෙක්පතෙහි ඇති චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවෙහි කිසිවක් නොලිවීම
- සුදුසු පරිදි රේඛනය කිරීම

*(01 × 02 = ලකුණු 02 යි)*

(ii) (අ) අසත්‍ය

(ආ) සත්‍ය

(ඉ) අසත්‍ය

(ඊ) අසත්‍ය

(½ × 04 = ලකුණු 02 යි)

(iii) (අ)

- යවන්නා
- පණිවිඩය
- මාධ්‍යය
- ලබන්නා

(½ × 02 = ලකුණු 01 යි)

(ආ) යවන්නා - විදුහල්පති

පණිවිඩය - විශේෂ රැස්වීමක් මාර්තු 27 දින ප.ව. 3 ට පාසලේ දී පැවැත්වේ.

මාධ්‍යය - ලිඛිත

ලබන්නා - දෙමාපියන්

(½ × 02 = ලකුණු 01 යි)

(iv)

- මාර්ගය - අධිවේගී මාර්ගය
- මාධ්‍යය - බස් රථය
- බලය - ඩීසල්
- පර්යන්තය - මාතර බස් නැවතුම්පොළ / පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ

(½ × 04 = ලකුණු 02 යි)

| 03 | (i) | (ii) | | | | (iii) | | (iv) | — |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අ | ආ | ඉ | ඊ | අ | ආ | | |
| | 02 | ½ | ½ | ½ | ½ | 01 | 01 | 02 | |

**4.** (i) ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) කළමනාකරණ ක්‍රියාවලියේ ඉතා වැදගත්ම කළමනාකරණ කාර්යය මෙහෙයවීමයි.

(ආ) ව්‍යාපාරයක අලෙවිය වැඩිකර ගැනීම සඳහා යොදාගන්නා විවිධ උපක්‍රම අලෙවිකරණ මිශ්‍රයේ ප්‍රවර්ධනයයි.

(ඉ) ආයෝජනයක අවදානම සහ ප්‍රතිලාභය අතර සෘජු සම්බන්ධතාවක් පවතී.

(ඊ) සංස්ථාපිත සමාගම්වල කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීමට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලබයි.

(ලකුණු 02 යි)

(iii) 'අමරස නිපැයුම්' ව්‍යාපාරය විසින් නිෂ්පාදනය කරනු ලැබූ 'කොස් ඇට පිටි' හඳුන්වාදීමේ කටයුතු ඉතා සාර්ථකව සිදුවිය. ඒ සඳහා අනුගමනය කළ පියවර කිහිපයක් පහත දැක්වේ.

A - කොස් ඇට පිටි පැකට්ටුවේ ඇසුරුම පරිසර හිතකාමී ලෙස සකස් කිරීමට තීරණය කිරීම

B - පළමු මාසයේ විකුණුම් වාර්තා විශ්ලේෂණය කිරීමෙන් පසු විකුණුම් මිල මත 2% ක වට්ටමක් ලබා දීම

C - සෘජු බෙදාහැරීම් කටයුතු සඳහා විකුණුම් සේවකයින් බඳවා ගැනීම

ඉහත එක් එක් පියවරෙහි සඳහන් වන කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යය සහ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය ලියන්න. (පිළිතුරු සැපයීම සඳහා පහත ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න. පළමු පියවර (A) සටහන් කර දක්වා ඇත.)

| පියවර | කළමනාකරණ කාර්යය | අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යය |
|---|---|---|
| A | සැලසුම්කරණය | නිෂ්පාදිතය |
| B | | |
| C | | |

(ලකුණු 02 යි)

(iv) රුවන් තම රු. 500 000 ක විශ්‍රාම පාරිතෝෂිකය ස්ථාවර තැන්පතුවක ද, නුවන් තම රු. 500 000 ක විශ්‍රාම පාරිතෝෂිකය කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ද ආයෝජනය කරන ලදී. වසරක් අවසානයේ රුවන්ට රු. 40 000 ක් ද, නුවන්ට රු. 75 000 ක් ද ප්‍රතිලාභ ලෙස හිමි විය.

(අ) ඉහත සිද්ධියේ රුවන් සහ නුවන් ලද ප්‍රතිලාභ හඳුන්වන පද වෙන වෙන ම ලියන්න.

(ආ) සමාන මුදලක්, සමාන කාල පරිච්ඡේදයක් සඳහා ආයෝජනය කළ ද, රුවන්ට වඩා වැඩි ප්‍රතිලාභයක් නුවන්ට ලැබීමට හේතුව කුමක් ද?

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**4.**

(i)
- ආයෝජනයේ අරමුණ
- ආයෝජනයේ අවදානම
- ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ

*(01 × 02 = ලකුණු 02 යි)*

(ii)
(අ) අසත්‍යයි
(ආ) සත්‍යයි
(ඉ) සත්‍යයි
(ඊ) අසත්‍යයි

*(½ × 04 = ලකුණු 02 යි)*

(iii)

| පියවර | කළමනාකරණ කාර්යය | අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යය |
|---|---|---|
| A | සැලසුම්කරණය | නිෂ්පාදිතය |
| B | පාලනය | මිල |
| C | සංවිධානකරණය | ස්ථානය |

*(½ × 04 = ලකුණු 02 යි)*

(iv) (අ) රුවන් ලද ප්‍රතිලාභය - පොළී ආදායම

නුවන් ලද ප්‍රතිලාභය - ලාභාංශ ආදායම

***(½ × 02 = ලකුණු 01 යි)***

(ආ) කොළඹ කොටස් වෙළෙඳපොල ආයෝජනයෙහි අවදානම, ස්ථාවර තැන්පතුවක ආයෝජනයෙහි අවදානමට වඩා වැඩි නිසා

***(ලකුණු 01 යි)***

| 04 | (i) | (ii) | | | | (iii) | (iv) | | — |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අ | ආ | ඉ | ඊ | | අ | ආ | |
| | 02 | ½ | ½ | ½ | ½ | 02 | 01 | 01 | |

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**5.** (i) ව්‍යාපාරයක ලෙජරයේ දැකිය හැකි වගකීම් ගිණුම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු දෙකකට අදාළ ද්විත්ව සටහන් පහත දැක්වේ.

(අ) ගැනුම් ගිණුම හර රු. 20 000
ණයහිමි ගිණුම බැර රු. 20 000

(ආ) මුදල් ගිණුම හර රු. 4 500
දුන් වට්ටම් ගිණුම හර රු. 500
ණයගැති ගිණුම බැර රු. 5 000

ඉහත සිදු වී ඇති එක් එක් ගනුදෙනුව ලියන්න. (ලකුණු 02 යි)

(iii) චාමරගේ ව්‍යාපාරයේ 2020.01.01 දිනට පැවති සියලුම වත්කම් සහ වගකීම් ශේෂ පහත දැක්වේ.

ලී බඩු ………………………………. රු. 250 000
බඩු තොගය ……………………….. රු. 140 000
ණයහිමියෝ ……………………….. රු. 20 000
බැංකු ණය ……………………….. රු. 100 000
මුදල් ……………………………….. රු. 30 000

2020.01.07 දිනෙන් අවසන් සතිය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. රු. 20 000 ක බඩු තොගයක් ණයට ගැනීම
2. රු. 3 000 ක සේවක වැටුප් ගෙවීම
3. පිරිවැය රු. 40 000 ක් වූ බඩු තොගයක් රු. 50 000 කට අත්පිට මුදලට විකිණීම

**අවශ්‍ය වන්නේ:**

(අ) ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දැක්වීම
(පිළිතුරු සැපයීම සඳහා පහත ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න.)

| ගනුදෙනුව | වත්කම් (රු.) | | | = හිමිකම් (රු.) | + වගකීම් (රු.) | |
|---|---|---|---|---|---|---|
| | ලී බඩු | + බඩු තොගය | + මුදල් | = හිමිකම | + බැංකු ණය | + ණයහිමියෝ |
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |

(ආ) ඉහත ගනුදෙනුවලට පසු 2020.01.07 දිනට ව්‍යාපාරයේ පහත අයිතමවල ශේෂ දැක්වීම
(1) මුදල් (2) හිමිකම (ලකුණු 04 යි)

(iv) රාහුල්ගේ ව්‍යාපාරයේ 2020 දෙසැම්බර් මාසයේ මුදල් ගනුදෙනු පහත වගුවේ දැක්වේ. 2020.12.01 දිනට මුදල් ශේෂය රු. 12 500 ක් විය.

| දිනය | ලදුපත් අංකය | වවුචර් අංකය | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2020.12.02 | 01 | - | බැංකු ණයක් ගැනීම | 50 000 |
| 2020.12.05 | - | 001 | බඩු තොගයක් ගැනීම | 45 000 |
| 2020.12.10 | - | 002 | කඩකුලී ගෙවීම | 1 500 |
| 2020.12.15 | 02 | - | අත්පිට විකුණුම් | 25 000 |
| 2020.12.20 | 03 | - | ණයගැතියෙකුගෙන් මුදල් ලැබීම් | 10 000 |
| 2020.12.30 | - | 003 | සේවක වැටුප් ගෙවීම | 30 000 |

**අවශ්‍ය වන්නේ:**

ඉහත ගනුදෙනු රාහුල්ගේ ව්‍යාපාරයේ මුදල් පොතේ සටහන් කර 2020.12.31 දිනට මුදල් පොත තුලනය කිරීම

(ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

**5.**

(i)
- ණයහිමි ගිණුම
- බැංකු ණය ගිණුම
- උපචිත වියදම් ගිණුම / ගෙවිය යුතු වියදම් ගිණුම

*(01 × 02 = ලකුණු 02 යි)*

(ii) (අ) රු. 20 000 ක භාණ්ඩ ණයට ගැනීම

*(ලකුණු 01 යි)*

(ආ)
- ණයගැතියෙකුගෙන් මුදල් ලැබුණා රු. 4 500. දුන් වට්ටම රු. 500.
- 10% ක වට්ටමකට යටත්ව රු. 5 000 ක ණයගැතියෙකුගෙන් මුදල් ලබා ගැනීම
- 10% ක වට්ටමක් සහිත ව ණයගැතියෙකුගෙන් මුදල් ලැබුණා රු. 4 500
- රු. 500 ක වට්ටමක් අඩුකර ගෙන ණයගැතියෙකුගෙන් ලද මුදල රු. 4 500

*(01 × 01 = ලකුණු 01 යි)*

(iii) (අ)

| ගණුදෙනුව | වත්කම් (රු.) | | | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ලී බඩු | + බඩු තොගය | + මුදල් | = | ප්‍රාග්ධනය | + | බැංකු ණය | + ණයහිමියෝ | |
| 1. | | + 20 000 | | = | | | | + 20 000 | ½ |
| 2. | | | - 3 000 | = | - 3 000 | | | | ½ |
| 3. | | - 40 000 | + 50 000 | = | + 10 000 | | | | 01 |

*(ලකුණු 02 යි)*

(ආ) (1) මුදල් = රු. 77 000 *(ලකුණු 01 යි)*

(2) හිමිකම = රු. 307 000 *(ලකුණු 01 යි)*

(iv)

**මුදල් පොත**

| දිනය | ල. අ | විස්තරය | ස. පි. | වට්ටම රු | දිනය | ව. අ | විස්තරය | ස. පි | වට්ටම රු |
|---|---|---|---|---|---|---|---|---|---|
| 20.12.01 | | ශේෂය ඉ/ගෙ | | 12 500 | 20.12.05 | 001 | ගැණුම් ගිණුම | | 45 000 |
| 20.12.02 | 01 | බැංකු ණය ගිණුම | | 50 000 | 20.12.10 | 002 | කඩකුලී ගිණුම | | 1 500 |
| 20.12.15 | 02 | විකුණුම් ගිණුම | | 25 000 | 20.12.30 | 003 | සේවක වැටුප් ගිණුම | | 30 000 |
| 20.12.20 | 03 | ණයගැති ගිණුම | | 10 000 | 20.12.31 | | ශේෂය ප/ගෙ | | 21 000 |
| | | | | 97 500 | | | | | 97 500 |
| 21.01.01 | | ශේෂය ඉ/ගෙ | | 21 000 | | | | | |

*(ලකුණු 04 යි)*

| 05 | (i) | (ii) | | (iii) | | (iv) | |
|---|---|---|---|---|---|---|---|
| | | අ | ආ | අ | ආ | | — |
| | 02 | 01 | 01 | 02 | 02 | 04 | |

6. (i) මුදල් පොත තුළින් ඉටු කරන කාර්ය **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) සපත්තු නිෂ්පාදන ව්‍යාපාරයක නුපුහුණු ගිණුම් ලිපිකරුවකු විසින් 2020 සැප්තැම්බර් මාසය සඳහා පිළියෙල කළ නිෂ්පාදන පිරිවැය ලේඛනය පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| සම් සඳහා පිරිවැය | 30 000 |
| සපත්තු සකසන්නාගේ වැටුප | 15 000 |
| කර්මාන්ත ශාලාවේ කුලිය | 30 000 |
| ප්‍රචාරණය | 10 000 |
| සපත්තු ඇලවීමේ ද්‍රව්‍ය | 5 000 |
| බෙදාහැරීමේ ලොරි රථ රියදුරාගේ වැටුප | 10 000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | 100 000 |

- නිෂ්පාදනය කළ සපත්තු කුට්ටම් ගණන 200 කි.

සපත්තු කුට්ටමක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(iii) කසුන්ගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව සමාන නොවී ය. වෙනසට හේතු පහත දැක්වේ.

- ගෙවූ විදුලි ගාස්තු රු. 7000 මුදල් පොතේ නිවැරදිව සටහන් කර විදුලි ගාස්තු ගිණුමට රු. 700 ක් ලෙස හර කිරීම
- විකුණුම් ගිණුමේ බැර පැත්ත රු. 2000 ක් අඩුවෙන් එකතු වී තිබීම
- යන්ත්‍ර අලුත්වැඩියා වියදම් රු. 15000 යන්ත්‍ර ගිණුමට හර කර තිබීම
- ලද වට්ටම් ගිණුමේ ශේෂය වූ රු. 2300 ශේෂ පිරික්සුමට උපුටාගෙන නොතිබීම

**අවශ්‍ය වන්නේ:**

(අ) අවිනිශ්චිත ගිණුම

(ආ) 2020.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙහි අවිනිශ්චිත ගිණුමේ ශේෂය පැවතියේ කුමන තීරුවේ ද යන්න සඳහන් කිරීම (ලකුණු 04 යි)

(iv) පහත දැක්වෙන්නේ සිරිමල්ගේ ව්‍යාපාරයේ 2020 දෙසැම්බර් මාසයේ බැංකු ගිණුම හා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයයි.

**බැංකු ගිණුම**

| දිනය | ලදු අං. | විස්තරය | ස.පි | වටිනාකම (රු.) | දිනය | චවු. අං. | විස්තරය | ස.පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 12.01 | | ශේෂය ඉ/ගෙ | | 22 000 | 12.05 | | ගැනුම් (812301) | | 20 000 |
| 12.08 | | චෙක් තැන්පත් (711322) | | 15 500 | 12.10 | | ණයහිමි (812302) | | 3 000 |
| | | | | | 12.16 | | වේතන (812303) | | 24 000 |
| 12.10 | | මුදල් තැන්පත් | | 25 000 | 12.26 | | කඩකුලී (812304) | | 5 000 |
| 12.28 | | චෙක් තැන්පත් (100100) | | 12 000 | 12.31 | | ශේෂය ප/ගෙ | | 22 500 |
| | | | | 74 500 | | | | | 74 500 |

**බැංකු ප්‍රකාශනය**

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 12.01 | ශේෂය ඉ/ගෙ | | | 22 000 |
| 12.07 | චෙක් (812301) | 20 000 | | 2 000 |
| 12.10 | චෙක් තැන්පත් | | 15 500 | 17 500 |
| 12.10 | චෙක් (812302) | 3 000 | | 14 500 |
| 12.10 | මුදල් | | 25 000 | 39 500 |
| 12.20 | චෙක් (812303) | 24 000 | | 15 500 |
| 12.23 | ස්ථාවර නියෝග ගෙවීම් (රක්ෂණ ගාස්තු) | 2 000 | | 13 500 |
| 12.30 | බැංකු ගාස්තු | 1 000 | | 12 500 |

**අවශ්‍ය වන්නේ:**

(අ) සිරිමල්ගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ ශේෂය අසමාන වීමට හේතු ලිවීම

(ආ) සිරිමල්ගේ ව්‍යාපාරයේ 2020.12.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

**6.**

(i)
- මූලික පොතක කාර්යය
- ලෙජර් ගිණුමක කාර්යය

*(01 × 02 = ලකුණු 02 යි)*

(ii)

**නිෂ්පාදන පිරිවැය ලේඛනය**

| | රු. | රු. |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය - සම් | 30 000 | |
| සෘජු ශ්‍රම පිරිවැය - සපත්තු සාදන්නාගේ වැටුප | 15 000 | |
| **ප්‍රාථමික පිරිවැය** | | 45 000 |
| කර්මාන්තශාලා කුලිය | 30 000 | |
| සපත්තු ඇලවීමේ ද්‍රව්‍ය | 5 000 | |
| **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** | | 35 000 |
| නිෂ්පාදන පිරිවැය | | 80 000 |

සපත්තු කුට්ටමක පිරිවැය = $\frac{\text{(½)}}{\text{(½)}}$

= රු. ______ (01)

(ලකුණු 02 යි)

(iii) (අ)

**අවිනිශ්චිත ගිණුම**

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | ශේෂ පිරික්සුමේ වෙනස | | 2 000 | | | | |
| | විකුණුම් ගිණුම | | 2 000 (01) | | විදුලි ගාස්තු ගිණුම | | 6 300 (01) |
| | ................................ | | 2 300 (01) | | | | |
| | | | 6 300 | | | | 6 300 |

(ලකුණු 03 යි)

(ආ) ශේෂ පිරික්සුමේ හර තීරුවේ ය.

(ලකුණු 01 යි)

(iv) (අ)
- තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත් (චෙ.අ 100100) රු. 12 000
- නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් (චෙ.අ 812304) රු. 5 000
- ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් නොවූ ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ ගාස්තු රු. 2 000
- ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකු ගාස්තු රු. 1 000

(½ x 04 = ලකුණු 02 යි)

## බැංකු ගිණුම

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | ශේෂය ඉ/ගෙ | | 22 500 ½ | | ස්ථාවර තියෝග - රක්ෂණ ගාස්තු | | 2 000 ½ |
| | | | | | බැංකු ගාස්තු | | 1 000 ½ |
| | | | | | ශේෂය ප/ගෙ | | 19 500 ½ |
| | | | 22 500 | | | | 22 500 |
| | ශේෂය ඉ/ගෙ | | 19 500 | | | | |

*(ලකුණු 02 යි)*

| 06 | (i) | (ii) | (iii) | (iv) අ | (iv) ආ | |
|---|---|---|---|---|---|---|
| | 02 | 02 | 04 | 02 | 02 | — |

7. (i) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ලැබීම් හා ගෙවීම් ගිණුම සහ ආදායම් ප්‍රකාශනය අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) රන්තරු ළමා සමාජයේ සාමාජික සංඛ්‍යාව 50 කි. එක් සාමාජිකයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 100 කි. 2020.12.31 දිනෙන් අවසන් වර්ෂයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| 2020 වර්ෂයේ දී ලැබුණු සාමාජික මුදල ............................ | 40 000 |
| පරණ පුවත්පත් අලෙවියෙන් ලද මුදල .............................. | 500 |
| විදුලි බිල ගෙවීම.............................................. | 12 000 |
| සංග්‍රහ වියදම් ගෙවීම ........................................ | 1 500 |
| ලී බඩු මිලදී ගැනීම සඳහා ගෙවීම ................................ | 100 000 |
| වෙනත් වියදම් ගෙවීම.......................................... | 2 500 |

- ලී බඩු වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලැබේ.

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රන්තරු ළමා සමාජයේ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරන්න. (ලකුණු 02 යි)

(iii) සිත්මිණිගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2020.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| 2020.01.01 දිනට තොගය .................................... | 28 000 | |
| ගැනුම් ................................................. | 350 000 | |
| ගෙන ඒමේ කුලී............................................ | 1 500 | |
| විකුණුම් ................................................ | | 480 000 |
| ණයගැතියෝ ............................................... | 37 000 | |
| ණයහිමියෝ ............................................... | | 50 000 |
| ආයෝජන ................................................. | 50 000 | |
| විදුලි ගාස්තු ............................................ | 25 000 | |
| මුදල් ශේෂය............................................... | 40 000 | |
| බැංකු ශේෂය .............................................. | | 12 000 |
| දුන් වට්ටම් .............................................. | 1 200 | |
| ලද වට්ටම් ............................................... | | 2 700 |
| ඉඩම් සහ ගොඩනැගිලි (පිරිවැයට) ............................ | 400 000 | |
| ප්‍රචාරණ වියදම් ........................................... | 20 000 | |
| 8% බැංකු ණය ............................................ | | 100 000 |
| ප්‍රාග්ධනය ............................................... | | 308 000 |
| | 952 700 | 952 700 |

අතිරේක තොරතුරු:

- 2020.12.31 දිනට ඉතිරි තොගය රු. 32 000 කි.
- 2020.12.31 දිනට ණයගැතියන්ගෙන් රු. 2 000 ක් බොල් ණය ලෙස කපා හරින ලදී.
- ලැබිය යුතු ආයෝජන ආදායම රු. 5 000 කි.

**අවශ්‍ය වන්නේ:**

(අ) 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04 යි)

(ආ) 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

**7.**

(i)

| ලැබීම් ගෙවීම් ගිණුම | ආදායම් ප්‍රකාශනය |
|---|---|
| • මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කරයි.<br>• කාලච්ඡේදය තුළ සියලුම මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කරයි.<br>• අවසාන ශේෂයෙන් කාලච්ඡේදය අවසානයේ අත ඉතිරි මුදල් ශේෂය පෙන්නුම් කරයි.<br>• මුදල් පදනමට පිළියෙල කරයි.<br>• වෙළඳ ව්‍යාපාරයක මුදල් පොතට බොහෝ දුරට සමාන වේ. | • ආදායම් හා වියදම් පමණක් සටහන් කරයි.<br>• කාලච්ඡේදයට අදාළ ආදායම් හා වියදම් පමණක් සටහන් කරයි.<br>• අවසාන ශේෂයෙන් අතිරික්තය හෝ ඌණතාවය පෙන්නුම් කරයි.<br>• උපචිත පදනමට පිළියෙල කරයි.<br>• වෙළඳ ව්‍යාපාරයක ලාභ හෝ අලාභ ප්‍රකාශයට බොහෝ දුරට සමාන වේ. |

*(01 × 02 = ලකුණු 02 යි)*

(ii)

**රන්තරු ළමා සමාජය**
**2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් ප්‍රකාශනය**

| | රු. | රු. |
|---|---|---|
| <u>ආදායම්</u> | | |
| සාමාජික මුදල් | 60 000 (½) | |
| පුවත්පත් අලෙවියෙන් | ★ 500 | |
| | | 60 500 |
| <u>වියදම්</u> | | |
| විදුලි වියදම | ★ 12 000 | |
| සංග්‍රහ වියදම් | ★ 1 500 | |
| ලී බඩු ක්ෂය | 10 000 (½) | |
| වෙනත් වියදම් | ★ 2 500 | |
| | | (26 000) |
| අතිරික්තය | | 34 500 (½) |

(★ 4 = ලකුණු ½ යි)
(ලකුණු 02 යි)

(iii) (අ)

**සිත්මිණ ව්‍යාපාරය**
**2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ලාභ හෝ අලාභ ප්‍රකාශය** (½)

| | රු. | රු. | | රු. | රු. |
|---|---|---|---|---|---|
| 2020.01.01 දිනට තොගය | | 28 000 | විකුණුම් | | 480 000 |
| එකතු කළා : ගැණුම් | 350 000 | | | | |
| ගෙනඒමේ කුලි | 1 500 | 351 500 | | | |
| විකිණීමට ඇති තොග පිරිවැය | | 379 500 | | | |
| අඩු කළා : 2020.12.31 තොගය | | (32 000) (½) | | | |
| විකුණුම් පිරිවැය | | 347 500 (½) | | | |
| දළ ලාභය ප/ගෙ | | 132 500 (½) | | | |
| | | 480 000 | | | 480 000 |
| **බෙදාහැරීමේ වියදම්** | | | | | |
| බොල් ණය | 2 000 (½) | | දළ ලාභය ඉ/ගෙ | | 132 500 |
| දුන් වට්ටම් | 1 200 | | වෙනත් ආදායම් | | |
| ප්‍රචාරණ වියදම් | 20 000 | 23 200 | ආයෝජන ආදායම් | 5 000 | (½) |
| | | | ලද වට්ටම | 2 700 | 7 700 |
| **පරිපාලන වියදම්** | | | | | |
| විදුලි ගාස්තු | 25 000 | 25 000 | | | |
| **මූල්‍ය වියදම්** | | | | | |
| බැංකු ණය පොලී | 8 000 (½) | 8 000 | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙ.ගි | (½) | 84 000 | | | |
| | | 140 200 | | | 140 200 |

*(ලකුණු 04 යි)*

(ආ)

**සිත්මිණ ව්‍යාපාරය**
**2020.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය** (½)

| | රු. | රු. | | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු. (½) |
|---|---|---|---|---|---|---|
| | | | <u>ජංගම නොවන වත්කම්</u> | | | |
| ප්‍රාග්ධනය | 308 000 | | ඉඩම් හා ගොඩනැගිලි | 400 000 | - | 400 000 |
| එකතු කලා - | | | | 400 000 | - | 400 000 |
| ශුද්ධ ලාභය (½) | 84 000 | 392 000 | | | | |
| | | | ආයෝජන | | | 50 000 |
| <u>ජංගම නොවන වගකීම්</u> | | | <u>ජංගම වත්කම්</u> | | | |
| 8% බැංකු ණය | | 100 000 | 2020.12.31 දිනට තොගය | | 32 000 | (½) |
| | | | ණයගැතියෝ | | 35 000 | (½) |
| <u>ජංගම වගකීම්</u> | | | ලැබිය යුතු ආයෝජන ආදායම් | | 5 000 | (½) |
| ණයහිමියෝ | 50 000 | | මුදල් | | 40 000 | 112 000 |
| බැංකු අයිරාව | 12 000 (½) | | | | | |
| උප. බැංකු ණය පොලී | 8 000 (½) | 70 000 | | | | |
| | | 562 000 | | | | 562 000 |

*(ලකුණු 04 යි)*

| 07 | (i) | (ii) | (iii) අ | (iii) ආ | — |
|---|---|---|---|---|---|
| | 02 | 02 | 04 | 04 | |

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(iii) (අ)

**සිත්මිණගේ ව්‍යාපාරය**
**2020.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**
**(ආදායම් ප්‍රකාශය) ලාභ හෝ අලාභ ප්‍රකාශනය** (½)

| | රු. | රු. | රු. |
|---|---|---|---|
| විකුණුම් | | | |
| අඩුකළා - විකුණුම් පිරිවැය : | | | 480 000 |
| 2020.01.01 දිනට තොගය | | 28 000 | |
| එකතු කළා - ගැනුම් | 350 000 | | |
| ගෙන ඒමේ කුලී | 1 500 | 351 500 | |
| විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ තොගයේ පිරිවැය | | 379 500 | |
| අඩුකළා - 2020.12.31 දිනට ඉතිරි තොගය | | (32 000) (½) | (½) |
| විකුණුම් පිරිවැය | | | (347 500) |
| දළ ලාභය | | | 132 500 |
| එකතු කළා - වෙනත් ආදායම් : | | | (½) |
| ආයෝජන ආදායම් | | 5 000 | (½) |
| ලද වට්ටම් | | 2 700 | 7 700 |
| | | | 140 200 |
| අඩුකළා වියදම් : | | | |
| බෙදාහැරීමේ වියදම් : | | | |
| බොල්ණය | 2 000 (½) | | |
| දුන් වට්ටම් | 1 200 | | |
| ප්‍රචාරණ වියදම් | 20 000 | 23 200 | |
| පරිපාලන වියදම් : | | | |
| විදුලි ගාස්තු | 25 000 | 25 000 | |
| මූල්‍ය වියදම් : | | | |
| බැංකු ණය පොලී | 8 000 (½) | 8 000 | (56 200) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙන ගියා (½) | | | 84 000 |

*(ලකුණු 04 යි)*

(ආ)

**සිත්මිණගේ ව්‍යාපාරය**
**2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** (½)

(½)

| | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු. |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් : | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 400 000 | - | 400 000 |
| | 400 000 | - | 400 000 |
| ආයෝජන | | | 50 000 |
| ජංගම වත්කම් | | | |
| 2020.12.31 දිනට තොගය | | 32 000 (½) | |
| ණයගැතියෝ | | 35 000 (½) | |
| ලැබිය යුතු ආයෝජන ආදායම් | | 5 000 (½) | |
| මුදල් | | 40 000 | 112 000 |
| මුළු වත්කම් | | | 562 000 |
| ප්‍රාග්ධනය | | 308 000 | |
| එකතු කළා - ශුද්ධ ලාභය | (½) | 84 000 | 392 000 |
| ජංගම නොවන වගකීම් : | | | |
| 8% බැංකු ණය | | | 100 000 |
| ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ | | 50 000 | |
| බැංකු අයිරාව | | 12 000 (½) | |
| උපචිත බැංකු ණය පොලී | | 8 000 (½) | 70 000 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 562 000 |

*(ලකුණු 04 යි)*

<table>
<tr><td rowspan="3">07</td><td rowspan="2">(i)</td><td rowspan="2">(ii)</td><td colspan="2">(iii)</td><td rowspan="3">12/12</td></tr>
<tr><td>අ</td><td>ආ</td></tr>
<tr><td>02</td><td>02</td><td>04</td><td>04</td></tr>
</table>

****

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] 10-11 සිංහල ව්‍යාකරණ
- [ ] 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] භූගෝල විද්‍යාව
- [ ] පුරවැසි අධ්‍යාපනය
- [ ] පෙරදිග සංගීතය
- [ ] නර්තනය
- [ ] නාට්‍ය හා රංග කලාව
- [ ] චිත්‍ර කලාව
- [ ] තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- [ ] සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- [ ] කෘෂි හා ආහාර තාක්ෂණය
- [ ] ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] බුද්ධ ධර්මය
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- [ ] Buddhism
- [ ] Mathematics - 1
- [ ] Mathematics - 2
- [ ] Biology
- [ ] Physics
- [ ] Chemistry
- [ ] History
- [ ] Business & Accounting Studies
- [ ] Geography
- [ ] Civic Education
- [ ] ICT
- [ ] Health & Physical Education
- [ ] 10-11 English Literary (Poetry)
- [ ] 10-11 English Literary (Drama)
- [ ] 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- [ ] Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] සිංහල රචනා අත්වැල
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව

- ඉතිහාසය
- ඉතිහාසය රූප සටහන් අශ්‍රිත කෙටි සටහන්
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ජපන් භාෂාව

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ගණිතය
- විද්‍යාව
- ඉතිහාසය
- පුරවැසි අධ්‍යාපනය
- භූගෝල විද්‍යාව
- පෙරදිග සංගීතය

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

- 10-ශ්‍රේණිය - විද්‍යාව
- 11-ශ්‍රේණිය - විද්‍යාව

## Grade 10 - Short Notes

**English Medium**

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies - 1
- Business & Accounting Studies - 2
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education

## Grade 10 - Model Papers

**English Medium**

- Mathematics
- Science
- Civic Education
- Geography
- English Activity Book
- English Work Book

## අනෙකුත් ග්‍රන්ථ

- හෙළදිව කතිකාවත
  - අරුණශාන්ත අමරසිංහ
- හොල්මන් අවතාර සහ යකදුරන්
  - අරුණශාන්ත අමරසිංහ
- සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.